කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් - 2017 / 2018
--------------------------------------------------

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගමේ ("සමාගම") 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනයේදී ප්‍රසිද්ධ වෘත්තියේ නියැලුණු වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා විසින් ලබා ගන්නා ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ .

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.ගි.ප්‍ර.) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා සහ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි.

**02.** මූල්‍ය ප්‍රකාශන

**2.1** මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.ගි.ප්‍ර.) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ නියමය පරිදි පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,
- මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට ,සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.ගි.ප්‍ර.) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 සහ 153 වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත්කර ඇති බවත්ය.

**2.3** නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| i. 2003 ජුනි 02 දිනැති, අංක පීඊඩී 12 දරන චක්‍රලේඛයේ 8.3.9 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර විසින් රේඛීය අමාත්‍යාංශය සඳහා හෝ වෙනත් රාජ්‍ය ආයතනයන් වෙනුවෙන් වියදම් දැරීමට හෝ සම්පත් යෙදීම නොකළ යුතු බව දක්වා තිබුණ ද ඊට පටහැනිව 2015 දෙසැම්බර් මාසයේ සිට සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් දක්වා කාලය තුළ රේඛීය අමාත්‍යාංශයට යෙදවූ සේවකයින් 10දෙනෙකු වෙනුවෙන් රු. 4,903,305 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. |
| ii. 2013 සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 දරණ චක්‍රලේඛයේ 3.5 ඡේදය | පාරිතෝෂික ප්‍රතිලාභ සඳහා වූ අරමුදලේ, 2018 මාර්තු 31 දින වන විට රු.14,899,666 ක් ආයෝජනය කළ යුතු වුවද සමාගම විසින් රු.6,587,639 ක් පමණක් ආයෝජනය කර තිබුණි. |

| | |
|---|---|
| (ආ) **2007** ඔක්තෝබර් **04** දිනැති හා අංක ඩී.එම්.එස්/**11**ජී/**09** දරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | සමාගම සඳහා නිලධාරින් බඳවා ගැනීම මාස **06**ක කොන්ත්‍රාත් කාලයකට යටත්ව හා ආයතනයේ ලාභදායිත්වය මත කොන්ත්‍රාත් කාලය දීර්ඝකිරීම පිළිබඳ සලකා බලන බව දන්වා තිබුණි. එසේ වුවද **2014** නොවැම්බර් **12** දිනැති අංක **25/2014** දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සමාගම් සම්බන්ධයෙන් අදාළ නොවූවද ,එම චක්‍රලේඛය පදනම් කරගනිමින් සේවකයන් **10** දෙනෙකුට **2014** නොවැම්බර් **01** දින සිට ස්ථිර පත්වීම් ලබා දී තිබුණි. |

**03.** මූල්‍ය සමාලෝචනය
-----------------------

**3.1** මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය රු.**2,931,823** ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අලාභය රු.**2,522,041** ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.**409,782** ක පසුබෑමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේදී විකුණුම් ආදායම රු.**10,994,317** කින් වැඩි වී තිබුණ ද රු. **21,342,087** ක් වූ තොග හිඟය මෙම අලාභයට හේතු වී තිබුණි.

**04.** මෙහෙයුම් සමාලෝචනය
-----------------------

**4.1** කාර්යසාධනය
---------------

සමාගමේ ක්‍රියාකාරි සැලැස්මේ වාර්ෂික මිනිරන් නිෂ්පාදනය මෙට්‍රික්ටොන් **775** සිට **900** දක්වා වැඩි කිරීමට සැලැසුම් කර තිබුණ ද සත්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් **750** කට වඩා වැඩිකර ගැනීමට නොහැකිවී තිබුණි.